2024 මුදල් වර්ෂය සඳහා

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ

කාර්ය සාධන වාර්තාව

2024 ஆம் ஆண்டிற்கான

காணி உரித்து நிர்ணயத் திணைக்களத்தின்

செயல் இலக்கு அறிக்கை

PERFORMANCE REPORT

of the Land Title Settlement Department
for the Financial Year 2024

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

காணி உரித்து நிர்ணயத் திணைக்களம்

LAND TITLE SETTLEMENT DEPARTMENT

බිම් සවිය ගීතය

බිම් සවියයි බිම් සවියයි //
ඔබගේ ශක්තිය බලය සදාතන
සත දිරිගැන්වූ උදාර නාමය
බිම් සවියයි ඒ බිම් සවියයි

වාද භේද නැති උරුමය සුරකින
හවුල් අවුල් නැති පරම සවිය ඇති
නිවහල් පලසක ලක්මව සතපන
අභීත මෙහෙවර බිම් සවියයි

බිමට සවිය රන් සවියක් වන ලෙස
දිවි හංහාවේ එතෙර දකින්නට
දේශ ශක්ති ස්ව ශක්ති සදාලන
අභීත මෙහෙවර බිම් සවියයි

පද රචනය	}	චන්දන මධුරසිංහ
සංගීතය		හිමිකම් විමර්ශන නිලධාරී/ අතිරේක රෙජිස්ට්‍රාර්
ගායනය		උඩුනුවර ප්‍රාදේශීය කාර්යාලය

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්වරයාගේ පණිවිඩය

වර්ෂ 1903 දී ස්ථාපිත කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මේ වන විට අවු. 121 ක කාලයක් සම්පූර්ණ කර ඇත. 1903 වසරේ සිට ක්‍රමිකව විකාශනය වූ මෙම දෙපාර්තමේන්තුව වර්තමානයේ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ලෙස හඳුන්වනු ලබයි. මෙම දෙපාර්තමේන්තුව යටතේ පනත් දෙකක් ක්‍රියාත්මක වේ. එනම් 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත හා 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතයි. ඒ අනුව ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත මඟින් ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු ද, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත මඟින් ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ කටයුතු ද සිදු කරනු ලබයි. එම ක්‍රියාවලීන් අවසානයේ ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ රජයේ සහ පෞද්ගලික ඉඩම් අයිතිය තීරණය කිරීමත්, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හිමිකම් සහතික පත්‍රයක් ඉඩම් හිමියන් වෙත ලබාදීමත් සිදු කරනු ලබයි. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ බිම් සවිය වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව අනගි සහයක් ලබා දෙන බවයි. ඒ සඳහා මෙම අවස්ථාවේදී සර්වේයර් ජනරාල්, අතිරේක සර්වේයර් ජනරාල් (හි.ලි.ප.) ඇතුළු කාර්යය මණ්ඩලයටත් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවෙන් වැඩසටහන සම්බන්ධීකරණය කළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්, සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (හි.ලි.ප.) හා කාර්යය මණ්ඩලයටත් ඉතා කෘතඥපූර්ව වෙමි. තවද ඉඩම් අමාත්‍යාංශය විසින් නිරන්තර උපදෙස් හා මහ පෙන්වීමෙන් ද මූල්‍ය ප්‍රතිපාදන සලසමින් ද දෙපාර්තමේන්තුව අරමුණ කරා මෙහෙයවීමේ ප්‍රධාන නියමුවා ලෙස කටයුතු කරනු ලැබේ.

2024 වර්ෂය අවසාන වන විට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ලබා ඇති ප්‍රගතිය ලෙස 1931 සිට 2024.12.31 දක්වා ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ නිරවුල් කිරීමේ ආඥාව මඟින් ගම් 9518ක් සඳහා අවසාන වාර්තා නිකුත් කර ඇත. 1998 සිට 2024.12.31 දක්වා හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අනුව 14 වගන්තිය යටතේ ඉඩම් කැබලි 1,035,055ක් සඳහා තීරණ ලබා දී ඇත.

කෙසේ වුවද 1998 සිට මේ දක්වා දෙපාර්තමේන්තුව ලබා ගෙන ඇති සමස්ත ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි අතර මේ සඳහා විවිධ බාහිර මෙන්ම අභ්‍යන්තර සාධකද ඒ සඳහා හේතු වී ඇත. ඉඩම් නිරවුල් කිරීමට අදාළ ගැටළු ලෙස මැනුම් ආශ්‍රිත තාක්ෂණික ගැටළු මතු වීම, පැරණි ලිපිගොනු අස්ථානගතව පැවතීම, බොහෝ පැරණි සිතියම් ඇසුරින් නිරවුල් කිරීමට සිදු වීම හා එම සිතියමට අදාළව ඇති ක්ෂේත්‍රය වර්තමානයේ වෙනස් වී තිබීම, පැරණි උරුමකරුවන්ගේ විස්තර සමඟ වත්මන් උරුමකරුවන් හඳුනා ගැනීමේ දී බොහෝ දුෂ්කරතාවයන්ට ලක්වීමෙන් උරුම විභාග වලදී ප්‍රමාදයන් සිදු වීම වැනි දෑ දැක්විය හැක. හිමිකම් ලියාපදිංචි කිරීමේ ගැටළු ලෙස පනතේ දුර්වලතා, අපේක්ෂිත කාර්ය මණ්ඩලයක් නොලැබීම, හිමිකම් නිරවුල් කිරීම වැනි සංකීර්ණ කාර්යය සඳහා පුහුණුව ලැබූ විමර්ශන කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුවෙන් ඉවත්වීම, පුද්ගලික ඉඩම් පිළිබඳ හිමිකම් තීරණය කිරීමේදී ක්ෂේත්‍ර විමර්ශනයේදී මතුව ඇති අනපේක්ෂිත තත්ත්වයන් හා ඉඩම් ආශ්‍රිත නඩු විශාල සංඛ්‍යාවක් පැවතීම වැනි ගැටළු වේ.

නමුත් එම බාධක මඟ හරවා ගනිමින් ඉදිරියේදී මුහුණ දීමට ඇති අභියෝගද ජයගනිමින් සාර්ථක ප්‍රගතියක් කරා ළඟා වීමට සැලසුම් සකස් කරමින් පවතී. ඒ යටතේ 2024.12.31 දින වන විට දිස්ත්‍රික්ක 19ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 111ක් තුළ බිම් සවිය වැඩසටහන ව්‍යාප්ත කර ඇති අතර 2025 වර්ෂයේදී එය දිස්ත්‍රික්ක 22ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 157ක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. තවද කැඩැස්තර සිතියම් සකස්කර ඇති සියලුම රජයේ ඉඩම් හිමිකම් පනත යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යලය මඟින් ඉටුකිරීමට හා 2025 අයවැය යටතේ ගරු ජනාධිපති/ මුදල් අමාත්‍ය විසින් "ඉඩම් හිමිකම් සංවර්ධනයට සහ ඉඩම්වල වාණිජමය භාවිතය වැඩි කිරීම" සඳහා බිම් සවිය වැඩසටහන කඩිනම් කිරීමට උපදෙස් ලබා දී ඇති බැවින් ප්‍රාදේශීය කාර්යාල ව්‍යාප්ත කර ප්‍රාදේශීය කාර්යාල මඟින් ආවරණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව වැඩි කරමින් වැඩි ප්‍රගතියක් ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ඇත.

අවසාන වශයෙන් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් මහජනතාව අපේක්ෂා කරන සේවාව උපරිම අයුරින් ලබා දීමට කැපවෙන සියළුම දෙපාර්තමේන්තු නිලධාරීන්ටත්, විශේෂයෙන් ප්‍රාදේශීය කාර්යාලවල සේවය කරන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන්ටත් සහකාර හිමිකම් විමර්ශන නිලධාරීන්ටත්, ඒ සඳහා සහය ලබාදෙන අනෙකුත් ආයතන හා ඒවායේ කාර්යමණ්ඩල නිලධාරීන්ටත් මාගේ කෘතවේදිත්වය පළ කරමි.

ශ්‍රී ලංකාව, දීර්ඝ ඉතිහාසයක් සහිත නිසාම ඉඩම් හිමිකම් නිරවුල් කිරීම පිළිබඳ සංකීර්ණ නීති සම්ප්‍රදායන්, භාවිතයන්ගෙන් මෙන්ම විචිත්‍ර ආකල්පයන්ගෙන් යුත් ජනතාවක් සහිත රටක් වන අතර එම ගැටළුකාරී සංකීර්ණ තත්ත්වයන් අවම කර ගනිමින් සෑම ඉඩමකටම නිරවුල් හිමිකමක් ලබා දීමට කටයුතු කිරීම ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ඒකායන අරමුණ වේ. මේ සඳහා මහජනතාව ඉඩම් හිමිකම් නිරවුල් කරගැනීමට ඇති කැමැත්ත, හිමිකම් සහතිකයක් ලබාගැනීම සඳහා ඇති උද්‍යෝගය මත දෙපාර්තමේන්තමේන්තුවේ ප්‍රගතිය අත්කරගැනීමට හැකිවනු ඇත.

පී.සී.ඩී. සිගේරා
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්

පටුන

පරිච්ඡේදය 01 ..... - 1 -

ආයතනික පැතිකඩ ..... - 1 -

1.1 හැඳින්වීම ..... - 1 -

1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර හා අරමුණු ..... - 2 -

1.3 කාර්යයන් ..... - 3 -

1.4 සංවිධාන සටහන ..... - 4 -

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ ..... - 4 -

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/අරමුදල් ..... - 6 -

1.7 විදෙස් ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ..... - 6 -

පරිච්ඡේදය 02 ..... -7-

ප්‍රගතිය හා ඉදිරි දැක්ම ..... -7-

පරිච්ඡේදය 03 ..... - 8 -

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ..... - 8 -

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ..... - 8 -

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 9

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ..... - 9 -

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 11

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 16

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 16

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 16

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 17

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 17

පරිච්ඡේදය 04 18

කාර්ය සාධන දර්ශක 18

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක 18

පරිච්ඡේදය 05 20

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 20

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 20

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 20

පරිච්ඡේදය 06 21

මානව සම්පත් පැතිකඩ 21

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 21

6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟයෙහි/අතිරික්තයෙහි බලපෑම 21

6.3 මානව සම්පත් සංවර්ධනය 22

පරිච්ඡේදය 07 24

අනුකූලතා වාර්තාව 24

ඇමුණුම්

01. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව - නිරවුල් කිරීමේ නිලධාරින් / කොමසාරිස්වරුන්ගේ /කොමසාරිස් ජනරාල්වරුන්ගේ නාම ලේඛනය

02. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන

03. විගණකාධිපතිවරයාගේ වාර්තාව

2024 මුදල් වර්ෂය සඳහා
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ
කාර්ය සාධන වාර්තාව

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

දෙපාර්තමේන්තු ඉතිහාසය

ඉඩම් නිරවුල් කිරීම යනු රජයේ ඉඩම් හා පුද්ගලික ඉඩම් වෙන් වෙන් වශයෙන් හීන්දු කර පුද්ගලික ලෙස හීන්දු කළ ඉඩම් අදාළ උරුමකරුවන් වෙත පුද්ගලික අයිතියට පවරා දීමත් එම ඉඩම් සඳහා ඔවුනට පිඹුරුපතක් නිකුත් කිරීමත් රජය සතු ඉඩම් රජය වෙත පවරා දීමත්ය. මෙවැනි ක්‍රියාවලියක් මේ රටට අවශ්‍ය වූයේ යම්කිසි ඓතිහාසික පසුබිමක් පදනම් කරගෙනය. වසර දහස් ගණනක් තිස්සේ මේ රටේ ජනතාව ඉඩම් භුක්ති විඳීමත්, පරිහරණය කිරීමත් කළ ද ඔවුන්ට එම ඉඩම්වල අයිතිය පවරා දිමක් සිදු නොවීය. ඉඩම්වල හිමිකම සනාථ කළ හැකි ඔප්පු තිරප්පු වැනි ලිඛිත සාක්ෂි කිසිවක් ඔවුන්ට නොවීය. මෙවැනි තත්ත්වයක් යටතේ බ්‍රිතාන්‍ය පාලකයින් විසින් රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම වැළැක්වීමට 1840 අංක 12 දරන ඉඩම් ආඥා පනත ප්‍රකාශයට පත් කරන ලදී.

මුලික වශයෙන් එම ආඥා පනතින් ප්‍රකාශ කරන ලද්දේ යම්කිසි පුද්ගලයකුට තම ඉඩම තමාට අයත් බව සනාථ කිරීමට නොහැකි වන්නේ නම්, එම ඉඩම රාජ සන්තක වන බවයි. මිනිසුන්ගේ පරම්පරාගත භුක්තිය හා වගාව බ්‍රිතාන්‍ය පාලකයින් විසින් සැලකිල්ලට නොගන්නා ලදී. ඔවුන් අදහස් කළේ අයිතිය සනාථ කිරීම ඔප්පු, තිරප්පු, සන්නස් වැනි ලිඛිත සාක්ෂි මඟින් කළ යුතු බවයි. මෙම තත්ත්වය යටතේ 1840 ඉඩම් ආඥා පනත නිසා මිනිසුන්ගේ ඉඩම් අක්කර දහස් ගණනින් ඔවුනට අහිමි විය. ලංකාවේ ජනතාවට සිදු වූ මෙම අසාධාරණය පිළිබඳව එවකට සිටි ලංකාවේ දේශීය නායකයින් සිය විරෝධතාවය හා කනස්සල්ල ප්‍රකාශ කරන ලදී. මේ අනුව මෙම ගැටලුවට විසඳුමක් වශයෙන් රජයේ ඉඩම් මොනවාද පුද්ගලික ඉඩම් මොනවාද යන්න හීන්දු කිරීමේ නිරවුල් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට බ්‍රිතාන්‍ය පාලකයින්ට සිදු විය. ඒ අනුව 1897 අංක 01 දරන මුඩු බිම් ආඥා පනත පනවන ලදී. මුලින් දිසාපතිවරුන් හා විශේෂ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය 1903 දී ස්ථාපිත කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතට පත් කරන ලදී. මුඩුබිම් ආඥා පනත ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ අඩුපාඩු හා ඉන් ජනතාවට සිදු වූ අසාධාරණකම් නැති කර ගැනීමේදී වඩාත් නිවැරදිවූත් නීත්‍යානුකූලවූත් නිරවුල් කිරීමේ ක්‍රියාවලියක් සිදු කිරීම සඳහා 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත පනවන ලදී.

දෙපාර්තමේන්තුවට අදාළ වූ මෙම ඉඩම් නිරවුල් කිරීමේ කාර්යය එසේම පවතින අතරතුරදී 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සම්මත වීම මත ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යයටද අවතීර්ණ විය. රජයේ සහ පුද්ගලික ඉඩම් වල අයිතිය තහවුරු කිරීම තුළින් දියුණු ඉඩම් කළමනාකරණ ක්‍රමයක් ඇති කිරීමත් ඉඩම් හා සම්බන්ධ වංචා, දූෂණ අවම කිරීමත් මෙහි ප්‍රමුඛ අරමුණ වේ. එමෙන්ම එකී කාර්ය භාර්ය වර්තමානය වන විට දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාර්ය බවට පත්වී ඇත.

1903 සිට 2024 දක්වා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නාම ලේඛනය

(ඇමුණුම් අංක 01 හි දක්වා ඇත)

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

සෑම ඉඩමකටම නිරවුල් හිමිකමක්

මෙහෙවර ප්‍රකාශය

ඉඩම් නිරවුල් කිරීමේ හා හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාදාමය තුළින් රජයේ හා පෞද්ගලික ඉඩම් අයිතිය තීරණය කොට, සෑම බිම් කොටසකම හිමිකම තහවුරු කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ දියුණු ඉඩම් කළමනාකරණ ක්‍රමයකට දායක වීම.

අරමුණු

1. ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ රජයේ සහ පුද්ගලික ඉඩම් අයිතිය තීරණය කිරීම.
2. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ උරුම අයදුම්පත් කැඳවීම, විමර්ශන කටයුතු සිදුකිරීම සහ හිමිකම් තීරණය කිරීම ඇතුළු අනෙකුත් කටයුතු කිරීම.
3. ආයතනික හැකියාව ශක්තිමත් කිරීම මඟින් හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු හා ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම.
4. මනා ක්‍රියාකාරිත්වයකින් යුත් හිමිකම් විමර්ශන කාර්යාල ප්‍රාදේශීය මට්ටමින් පවත්වාගෙ යාම මඟින් හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම.
5. හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතුවල සියලු අවස්ථාවන් සඳහා මහජන සහයෝගය ලබා ගැනීම සහ මහජන විශ්වාසය තහවුරු කරගැනීමට කටයුතු කිරීම.
6. ඉඩම් අයිතිය පිළිබඳ කාර්යක්ෂම සහ විශ්වාසනීය තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
7. කාර්යක්ෂම පරිපාලන සහ ගිණුම් ක්‍රම පවත්වාගෙන යාම.

1.3 කාර්යයන්

දෙපාර්තමේන්තුව සතු මූලික කාර්යයන් පහත දැක්වේ.

- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු, ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සහ කාර්යාලීය පරිපාලනය කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ක්‍රමවේදයන් සහ පටිපාටි හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.

- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමට අදාළ කටයුතු වන,

  අ) ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

  ආ) උරුම අයදුම්පත් කැඳවීම

  ඇ) හිමිකම් විමර්ශන පැවැත්වීම

  ඈ) හිමිකම් තීරණය කිරීම

  ඉ) හිමිකම් තීරණය ගැසට් කිරීම යනාදිය ඉටු කිරීම.

- ඉඩම් නිරවුල් කිරීමට අදාළ කටයුතු වන,

  අ) නිරවුල් කිරීමේ උරුම විභාග පැවැත්වීම

  ආ) නිරවුල් කරන ලද ඉඩම් මැන වෙන් කිරීමට යැවීම

  ඇ) නිරවුල් කිරීමේ ආඥා ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීම

  ඈ) නිරවුල් කිරීමෙන් පසු ගම් නිදහස් කිරීම යනාදිය ඉටු කිරීම.

- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු වලදී අදාළ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම.

- කාර්ය මණ්ඩලයේ රාජකාරී කාර්යක්ෂමව සිදුකිරීමට අවශ්‍ය පුහුණුව සහ අනෙකුත් සම්පත් අවශ්‍යතා හඳුනාගෙන ඒවා සපයා දීම.

- හිමිකම් විමර්ශනය සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සඳහා කාර්ය සාධන දර්ශක සැකසීම සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

- හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතුවල ප්‍රගතිය මාසිකව අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.

- ඉඩම් නිරවුල් කිරීමට අදාළ පැරණි සහ වටිනා ලේඛන සංරක්ෂණය කිරීම සඳහා කාර්යක්ෂම ලේඛන සංරක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාම.

- හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ මහජන අවබෝධය වර්ධනය කිරීම සහ සහයෝගය ලබා ගැනීම පිණිස දැනුවත් කිරීමේ රැස්වීම්, සාකච්ඡා සහ වැඩමුළු පැවැත්වීම.

- ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම සහ ඔවුන්ට අවශ්‍ය සම්පත් ලබාදීම මඟින් මහජන අවශ්‍යතා සපුරා ගැනීමට අවකාශ සැලසීම.

- වාර්ෂික ඇස්තමේන්තු, විසර්ජන ගිණුම්, රජයේ නිලධාරීන්ගේ ඇස්තමේන්තු ගිණුම් සහ මාසික ගිණුම් සාරාංශ සැකසීම.

1.4 සංවිධාන සටහන

(ඇමුණුම් අංක 02 හි දක්වා ඇත)

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- හිමිකම් නිරවුල් කිරීමේ අංශය
- ඉඩම් නිරවුල් කිරීමේ අංශය

දෙපාර්තමේන්තුවේ හිමිකම් ලියාපදිංචිය **යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල හා ආවරණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස**

අනු අංකය	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය කාර්යාල	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
1	බස්නාහිර	කොළඹ	හෝමාගම	හෝමාගම
2				කඩුවෙල
3				මහරගම
4			මොරටුව	මොරටුව
5			කැස්බෑව	කැස්බෑව
6			රත්මලාන	රත්මලාන
7			දෙහිවල	දෙහිවල
8			කෝට්ටේ	කෝට්ටේ
9			කොළඹ	තිඹිරිගස්යාය
10		ගම්පහ	මිනුවන්ගොඩ	දිවුලපිටිය
11				මිනුවන්ගොඩ
12			මීරිගම	මීරිගම I/II
13			මහර	මහර
14			අත්තනගල්ල	අත්තනගල්ල
15			දොම්පේ	දොම්පේ
16			ගම්පහ	ගම්පහ
17				ජා ඇල
18				වත්තල
19			කටාන	කටාන
20				මීගමුව
21		කළුතර	පානදුර	පානදුර
22				හොරණ
23				ඉංගිරිය
24			කළුතර	කළුතර
25				මතුගම
26			බුලත්සිංහල	බුලත්සිංහල
27	සබරගමුව	රත්නපුර	බලංගොඩ	බලංගොඩ
28				ඉඹුල්පේ
29			වැලිගෙපොල	වැලිගෙපොල
30			ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය
31				ගොඩකවෙල
32			රත්නපුරය	රත්නපුරය

33				නිවිතිගල
34				පැල්මඩුල්ල
35			කුරුවිට	කුරුවිට
36				අයගම
37		කෑගල්ල	ගලිගමුව	ගලිගමුව
38			රුවන්වැල්ල	රුවන්වැල්ල
39	දකුණ	ගාල්ල	ගාල්ල	ගාල්ල කඩවත් සතර
40				රත්ගම
41				බෝපේපෝද්දල
42			හික්කඩුව	හික්කඩුව
43				මාදම්පාගම
44			ඇල්පිටිය	ඇල්පිටිය
45				වැලිවිටිය දිවිතුර
46		මාතර	වැලිගම	වැලිගම
47			මාතර	මාතර
48				කිරින්ද
49				දික්වැල්ල
50				දෙවිනුවර
51				අකුරුස්ස
52			හක්මන	හක්මන
53		හම්බන්තොට	තිස්සමහාරාමය	ලුණුගම්වෙහෙර
54				තිස්සමහාරාමය
55				හම්බන්තොට
56			බෙලිඅත්ත	බෙලිඅත්ත
57	වයඹ	කුරුණෑගල	රිදීගම	රිදීගම
58			මල්ලවපිටිය	මල්ලවපිටිය
59				පොල්ගහවෙල
60			කුරුණෑගල	කුරුණෑගල
61				ගනේවත්ත
62			පන්නල	පන්නල
63			මීරිගම	අලව්ව
64			වාරියපොල	වාරියපොල
65				ගිරිබාව
66				මහව
67				නිකවැරටිය
68		පුත්තලම	වෙන්නප්පුව	වෙන්නප්පුව
69				නාත්තන්ඩිය
70			පුත්තලම	පුත්තලම
71	මධ්‍යම	මහනුවර	දොළුව/උඩපළාත	දොළුව/උඩපළාත
72				ගඟඉහලකෝරළේ
73			යටිනුවර	යටිනුවර
74				පූජා පිටිය
75			උඩුනුවර	උඩුනුවර
76			හාරිස්පත්තුව	හාරිස්පත්තුව
77			ගඟවටකෝරළේ	ගඟවටකෝරළේ
78				මිනිපේ
79		නුවරඑළිය	කොත්මලේ	කොත්මලේ
80		මාතලේ	දඹුල්ල	දඹුල්ල
81				නාවුල
82			ගලේවෙල	ගලේවෙල
83				විල්ගමුව

84				පල්ලෙපොල
85	උතුරු මැද	අනුරාධපුර	තඹුත්තේගම	තඹුත්තේගම
86				තලාව
87				රාජාංගනය
88				නොච්චියාගම
89			නැ.නු.ප	නැ.නු.ප
90				මිහින්තලේ
91				තිරප්පනේ
92		පොළොන්නරුව	හිඟුරක්ගොඩ	මැදිරිගිරිය
93				හිඟුරක්ගොඩ
94			තමන්කඩුව	තමන්කඩුව
95				ලංකාපුර
96				දිඹුලාගල
97	ඌව	මොණරාගල	මොණරාගල	සියඹලාණ්ඩුව
98				මොණරාගල
99				බුත්තල
100				වැල්ලවාය
101				මැදගම
102		බදුල්ල	හාරිස්පත්තුව	රිදීමාලියද්ද
103				මහියංගනය
104	නැගෙනහිර	මඩකලපුව	මඩකලපුව	මන්මුනේ උතුර
105		අම්පාර		අම්පාර
106		ත්‍රිකුණාමලය		ත්‍රිකුණාමලය
107	උතුර	යාපනය	නල්ලූර්	නල්ලූර්
108		කිලිනොච්චිය		කිලිනොච්චිය
109		මන්නාරම		මන්නාරම
110		මුලතිව්		මුලතිව්
111		වවුනියාව	වවුනියාව	වවුනියාව

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

අදාළ නොවේ.

1.7 විදෙස් ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අදාළ නොවේ.

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2024 වර්ෂයේදී 12 වගන්තිය යටතේ ඔසට් කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිතියම් 1164ක ඉඩම් කැබලි 110,085ක් මැනුම් සිදු කර අප දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති අතර කැබලි 62,463ක් සම්බන්ධයෙන් 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ ලබා දීමට දෙපාර්තමේන්තුව සමත්වී ඇත. මෙය 2023 වර්ෂයේදී පිළිවෙලින් සිතියම් 774 ක ඉඩම් කැබලි 74,376ක් හා 61,622ක් වේ. එමෙන්ම පනතේ 14 වගන්තිය යටතේ වන තීරණ අනුරින් මෙම වර්ෂයේදී ඉඩම් කැබලි 48,345ක් ඔසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇති අතර ඉඩම් කැබලි 43,542ක් හා සම්බන්ධ උපලේඛන භූමිකම් ලියාපදිංචිය සඳහා සහ භූමිකම් සහතික නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත යොමු කොට ඇත. භූමිකම් ප්‍රකාශිත ඔසට් නිවේදනය පිළිබඳ විරෝධතාවයක් ඇතොත් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි මාසයක කාල පරාසයකින් පසු භූමිකම් සහතික සැකසීම සඳහා රෙජිස්ට්‍රාර් කාර්යාලවලට යොමු කරන අතර 2025 වර්ෂය සඳහා 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ ලබා දීමට අපේක්ෂිත ඉලක්කය 104,000 බවද සඳහන් කරමි.

.....

ප්‍රධාන ඔණන් දීමේ නිලධාරි
නම : ඩී.පී.වික්‍රමසිංහ
තනතුර : ලේකම් - කෘෂිකර්ම, පශුසම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
දිනය : 2025.02. 11

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
"මිහිපත මැදුර" ඉඩම් මහ ලේකම් කාර්යාලය
ඒකක.1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල

.....

ඔණන් දීමේ නිලධාරි
නම : පී.සී.ඩී.සිඟේරා
තනතුර :ඉඩම් භූමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්
දිනය : 2025.02. 28

පී.සී.ඩී. සිංගෝ.
ඉඩම් භූමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්
නිරවුල් නිවැරදි නිලධාරි
ඉඩම් භූමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්
1200/6, "මිහිපත මැදුර"
[illegible]

පරිච්ඡේදය 03
වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එල්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2024		සටහන	2024	තක්‍ය 2023(නැවත ඉදිපන ලද)	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	**දේශීය භාණ්ඩ හා සේවා මත බදු**	**2**	-	-	**ඒසීඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	**බදු නොවන ආදායම් හා වෙනත්**	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		897,076,000	713,654,000	**ඒසීඒ-3**
-	තැන්පතු		952,311	5,611,102	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		34,455,947	31,499,249	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් **ලැබීම්**		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**932,484,258**	**750,764,351**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**932,484,258**	**750,764,351**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**932,484,258**	**750,764,351**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
729,022,378	වැටුප්, **වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ**	**5**	728,333,222	616,707,088	
36,280,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	34,727,429	28,734,944	**ඒසීඒ-2(ii)**
6,400,000	සහනාධාර, **ප්‍රදාන සහ මාරුකිරීම්**	7	6,349,781	7,581,461	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
771,702,378	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**769,410,432**	**653,023,493**	
	මූලධන වියදම්				
26,500,000	**මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්**	**10**	14,015,423	2,441,190	
19,000,000	**මූලධන වත්කම් අත්පත් කර ගැනීම්**	**11**	5,478,439	2,134,873	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසීඒ-2(ii)**
-	මූල්‍ය **වත්කම් අත්පත් කර ගැනීම**	**13**	-	-	
1,500,000	හැකියා වර්ධනය	**14**	1,482,898	1,503,740	
12,000,000	වෙනත් මූලධන වියදම්	**15**	6,682,404	4,624,169	
59,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**27,659,164**	**10,703,972**	
	තැන්පතු ගෙවීම්		2,943,377	9,039,977	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		47,845,610	35,973,002	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන **ලෙජර් ගිණුම් ගෙවීම්**		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		50,788,987	45,012,979	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**847,858,583**	**708,740,444**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**84,625,675**	**42,023,907**	
	අග්‍රම ගැලපුම් ප්‍රකාශය අනුව ශේෂය		**84,625,675**	**42,023,907**	**ඒසීඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසීඒ-3**
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

එසේ-5

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියන හා උපකරණ	එසිඒ-6	318,769,115	303,529,183
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	එසිඒ-5/5(අ)	74,694,245	61,304,582
මුදල් හා මුදල් සමාන දෑ	එසිඒ-3	-	-
මුළු වත්කම්		393,463,360	364,833,765
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
ඉද්ධ වත්කම්		74,132,994	58,752,266
දේපල පිරියන හා උපකරණ සංචිතය		318,769,115	303,529,183
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	එසිඒ-5(බ)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	එසිඒ-4	561,251	2,552,316
අඟ්‍රිම ශේෂය	එසිඒ-3	-	-
මුළු වගකීම්		393,463,360	364,833,765

පිටු අංක 7 සිට 30 දක්වෙන ඉහත එසිඒ 1 සිට එසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 31 සිට 47 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....

ප්‍රධාන ගණන් දීමේ නිලධාරි
නම : ඩී.පී.වික්‍රමසිංහ
තනතුර : ලේකම්- කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
දිනය : 2025.02. 11

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
"මිහිකත මැදුර" ඉඩම් මහ ලේකම් කාර්යාලය
අංක.1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

.....

ගණන් දීමේ නිලධාරි
නම : පී.සී.ඩී.සිගේරා
තනතුර: ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්
දිනය:2025.02. 28

ඒ.සී.ඩී. සිගේරා
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් හා
නිරවුල් කිරීමේ නිලධාරි
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ ඇපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

.....

ප්‍රධාන ගණකාධිකාරී
නම : එම්.එස්.එම්.පෙරේරා
දිනය: 2025.02. 28

M.S.M. Perera
Chief Accountant
Department of Land Title Settlement
1200/6, "Mihikatha Medura"
Rajamalwatta Road, Battaramulla.

9

Cute Check by

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2024 රු.	2023 (නැවත ඉලපන ලද) රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	42,379,283	31,060,370
අග්‍රිම ලැබීම්	897,076,000	713,654,000
අත්තිකාරම් අයකර ගැනීම්	38,861,110	41,056,515
තැන්පතු ලැබීම්	952,311	5,611,102
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	979,268,704	791,381,987
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	756,869,765	640,213,613
සහනාධාර සහ මාරුකිරීම්	6,349,781	7,581,461
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	137,308,358	87,785,132
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	48,364,135	36,057,832
තැන්පතු ගෙවීම්	2,943,377	9,039,977
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	951,835,416	780,678,015
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	27,433,288	10,703,972
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	27,433,288	10,703,972
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	27,433,288	10,703,972
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(27,433,288)	(10,703,972)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(0)	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	-
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

සටහන - (i)

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය
(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:287
වැඩසටහන් අංකය හා නාමය: 02 - සංවර්ධන වැඩසටහන

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/ කපාහැරීම/ අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය	සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු.25,000.00 අඩු	0	0.00
රු.25,000.01 වැඩි	0	0.00
එකතුව	0	0.00

අලාභයේ ස්වභාය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1.	0	0.00
2.	0	0.00
එකතුව	0	0.00

(ii) නවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

අගය	සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු.25,000.00 අඩු	0	0.00
රු.25,000.01 වැඩි	0	0.00
එකතුව	0	0.00

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1.	0	0.00
2.	0	0.00
එකතුව	0	0.00

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	රු.0.00
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	රු.0.00
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	රු.0.00

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ. 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

M.S.M. Perera
Chief Accountant
Department of Land Title Settlement
1200/6 "Mihikatha Medura"
Rajamalwatta Road, Battaramulla.

ප්‍රධාන ගණකාධිකාරී
එම්.එස්.එම්.පෙරේරා
දිනය : 2025.02.28

Cut check by

CamScanner

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

සටහන (ii)

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:287
වැඩසටහන් අංකය හා නාමය: 02 - සංවර්ධන වැඩසටහන

1. වර්ෂය තුළ සිදු වූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය	සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i) රු.25,000.00 අඩු	0	0.00
(ii) රු.25,000.01 වැඩි	0	0.00
එකතුව	0	0.00

2. වර්ෂය තුළ මු.රෙ.109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය (රු.)	අලාභයේ වටිනාකම (රු.)	අයකර ගැනීම් (රු.)	පොතෙන් කපා හල අගය (රු.)	කපා නොහල ඉදිරියට ගෙන යන ශේෂය (රු.)	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1 -	-	-	-	-	-	
2						
3						
4						
5						
එකතුව	-	-	-	-	-	

සටහන - සටහන (i) හි අතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ.109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

M.S.M Perera
Chief Accountant
Department of Land Title Settlement
Mihikatha Medura
Pitipana Road, Battaramulla

ප්‍රධාන ගණකාධිකාරි
එම්.එස්.එම්.පෙරේරා
දිනය : 2025.02. 28

check by

2024 වර්ෂය සඳහා සමුච්චිත බැඳීම්/ බැරකම් (වගකීම්) වාර්තාව

වෙත - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්
විසින් - අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මිලකරණ දෙපාර්තමේන්තුව
මහ භාණ්ඩාගාරය, කොළඹ 01

නව වගු අංකය - SA-92
පැරණි වගු අංකය
වාර්තා දිනය - 18/02/2025

ආයතනය	බැඳීම් අංකය	දිනය	කා වෙනද	වැය ශීර්ෂය	බැඳීම	බැඳීම් පෙම්ණ	බැරකම් දිනය	බැරකම් ප්‍රමාණය	අංශෝධිත බැරකම්	ගෙවන ලද	ඇයකම් පෙම්ණ	විත්ත සැපයුම් අංකය
රජය	C/2024/HR86	2024 දෙසැ.31	ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපා. – ප්‍රාදේශීය ගෙවීම	287-2-1-0-10 P	18,887.20	0.00	2024 දෙසැ.31	18,887.20	0.00	0.00	18,887.20	287
රජය	C/2024/HR87	2024 දෙසැ.31	ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපා. – ප්‍රාදේශීය ගෙවීම	287-2-1-0-11 P	1,000.00	0.00	2024 දෙසැ.31	1,000.00	0.00	0.00	1,000.00	287
රජය	C/2024/HR88	2024 දෙසැ.31	ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.	287-2-1-0-14 P	27,454.48	0.00	2024 දෙසැ.31	27,454.48	0.00	0.00	27,454.48	287
රජය	C/2024/HR89	2024 දෙසැ.31	ඔසන් සිස්ටම්ස් ඉන්ටග්‍රේටර්ස් (පුද්.) සමාගම	287-2-1-1-25 P	5,137,683.42	0.00	2024 දෙසැ.31	5,137,683.42	0.00	0.00	5,137,683.42	287

මෙය පරිගණකය මගින් ලබාගත් වේතනයකි

ප්‍රධාන ගණකාධිකාරී
ඉ.ම.හි.නි. දෙපාර්තමේන්තුව
දිනය : 2025.02.28

M.S.M. Perera
Chief Accountant
Department of Land Title Settlement
120/6, "Mihikatha Medura"
Rajamawatta Road, Battaramulla

Cat
check by

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 287
වැඩසටහන් අංකය හා නාමය : වැඩසටහන 02

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		නැත		

ප්‍රධාන ගණකාධිකාරී
එම්.එස්.එම්.පෙරේරා
දිනය : 2025.02.28

M.S.M. Perera
Chief Accountant
Department of Land Title Settlement
1200/6 "Mihikatha Medura"
Rajamalwatta Road, Battaramulla.

CamScanner

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් වකුලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2024.12.31 දිනට තත්ත්ව වාර්තාව

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 287

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2024.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	මහජන බැංකුව-බත්තරමුල්ල ශාඛාව	208100259027251	37,904,293.47	0	0	2025 ජනවාරි

.....
ප්‍රධාන ගණකාධිකාරි
එම්.එස්.එම්.පෙරේරා
දිනය : 2025.02. 28

M.S.M. Perera
Chief Accountant
Department of Land Title Settlement
1200/6 Mihikatha Medura"
Rajamalwatte Road, Battaramulla

Cat
Check by

CamScanner

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නැත					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්තන	679,880,000.00	771,702,378.00	769,410,431.93	99.7%
ප්‍රාග්ධන	59,000,000.00	59,000,000.00	27,659,164.41	46.88%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
1	ඉඩම් අමාත්‍යාංශය	බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම	180,000,000.00	180,000,000.00	167,858,288.30	93.25%
2	රාජ්‍ය පරිපාලනය	දීමනා/ වැටුප් ගෙවීම				
3	විශ්‍රාම වැටුප් දෙපා.	අත්තිකාරම් B ගිණුම ණය අය කර ගැනීම				

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		23,415,000.00		
9152	යන්ත්‍රෝපකරණ (වාහනද ඇතුලත්ව)		255,965,970.14		
9153	ඉඩම්		36,285,000.00		
9154	අස්පෘශ්‍ය වත්කම්		3,103,145.00		
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-		
9160	කෙරීගෙන යන වැඩ		-		
9180	බදු දෙන ලද වත්කම්		-		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

(අවසන් වාර්තාවට ඇතුලත් වේ.)

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

(I) 1998 අංක 21 දරණ පනතෙන් පැවරුන රාජකාරි

විශේෂිත දර්ශක	ඉලක්කය (ඉඩම් කැබලි සංඛ්‍යාව)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
12 වගන්තිය යටතේ ගැසට් කිරීම	100,000	*		
බෙදා දුන් හිමිකම් අයදුම්පත් ගණන	100,000			59.28%
හිමිකම් විමර්ශන පැවැත්වීම	120,000		85.72%	
ඉ.රෙ.පරීක්ෂණ පැවැත්වීම	80,000	**		
14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම	150,000	***		
14 වගන්තිය යටතේ ගැසට් කිරීම	80,000			60.43%
හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම	80,000			54.43%

* 12 වගන්තිය යටතේ ගැසට් කිරීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 110.09% කි.

** ඉඩම් රෙජිස්ට්‍රාර් පරීක්ෂණ සංඛ්‍යාවට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 49.58% කි.

*** 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 41.64% කි.

(II) 1931 අංක 20 දරණ පනතෙන් පැවරුන රාජකාරි

විශේෂිත දර්ශක	ඉලක්කය (ගම් සංඛ්‍යාව)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% -90%	75%-89%	50%-74%
උරුම විභාග පැවැත්වීම	12	100%		
මැන වෙන් කිරීම පරීක්ෂා කර නිරවුල් කිරීමේ ආඥාව සඳහා විධානය සැකසීම	8		75%	
නිරවුල් කරන ලද ඉඩම් සඳහා රේඛා සටහන් ඉල්ලුම් පත්‍ර පිළියෙල කර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වෙතින් රේඛා චිත්‍ර ගෙන්වා ගැනීම	3			66.66%
නිරවුල් කරන ලද ඉඩම් ලියාපදිංචි කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීම	8		*	
නිරවුල් කිරීමේ ආඥාව ඉඩම් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යැවීම	8		**	
නිරවුල් කිරීමේ ආඥාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම	7		***	
නිරවුල් කිරීමේ ආඥා ප්‍රසිද්ධ කරන ලද ගැසට්පත් (ඔප්පු හා පිඹුරුපත්) උරුමකරුවන්ට බෙදාදීම	3		****	
නිදහස් කරන ලද ගම් ගණන	7		*****	

*නිරවුල් කරන ලද ඉඩම් ලියාපදිංචි කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 12.5% කි.

** නිරවුල් කිරීමේ ආඥාව ඉඩම් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යැවීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 37.5%කි.

*** නිරවුල් කිරීමේ ආඥාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට අදාළ ප්‍රතිශතය 0 කි.

**** නිරවුල් කිරීමේ ආඥා ප්‍රසිද්ධ කරන ලද ගැසට්පත් (ඔප්පු හා පිඹුරුපත්) උරුමකරුවන්ට බෙදාදීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 33% කි.

***** නිදහස් කරන ලද ගම් ගණනට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 14.2%කි.

පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5 1.හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු (SDG 1.4)

ඉලක්කය / අරමුණු	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0% - 49%	50% - 74%	75% -100%
ස්ත්‍රී පුරුෂ භාවය සහ හිමිකම් මාදිලියට අනුව, නීත්‍යානුකූලව පිළිගත් ලිපි ලේඛන සහ සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය (1.4)	හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම (1.4.2)	12 වගන්තිය යටතේ ගැසට් කිරීම	*		
		බෙදා දුන් හිමිකම් අයදුම්පත් ගණන		59.28%	
		හිමිකම් විමර්ශන පැවැත්වීම			85.72%
		ඉ.රෙ.පරීක්ෂණ පැවැත්වීම		49.58%	
		14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම	41.64%		
		14 වගන්තිය යටතේ ගැසට් කිරීම		60.43%	
		හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම		54.43%	

* 12 වගන්තිය යටතේ ගැසට් කිරීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 110.09% කි.

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- දැනට බිම් සවිය වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 111ක ක්‍රියාත්මක වන අතර තවදුරටත් බිම් සවිය වැඩසටහන ව්‍යාප්ත කිරීමේ අරමුණින් ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 157 දක්වා වැඩි කිරීමට පියවර ගැනීම
- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සඳහා සංශෝධන ඇතුළත් කිරීමට පියවර ගැනීම.
- බිම්සවිය වැඩසටහනේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට දෙපාර්තමේන්තුව සතු මානව සම්පත් ප්‍රමාණවත් නොවීම.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6 1.සේවක සංඛ්‍යා කළමනාකරණය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	105	36	69
තෘතියික	07	05	02
ද්විතියික	1746	844	902
ප්‍රාථමික	254	164	90

6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟයෙහි බලපෑම

බිම් සවිය ක්‍රියාවලිය මුළු දිවයිනේම ක්‍රියාත්මක කිරීමේ පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන බැවින් ප්‍රාදේශීය කාර්යාල 55ක් මේ වන විට ආරම්භ කර ඇති අතර එම කාර්යාලවල මෙන්ම ප්‍රධාන කාර්යාලයේද සේවක පුරප්පාඩු පවතී. නමුත් මෙතෙක් එම පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇති බැවින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ, තෘතියික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු නිලධාරීන් අනුයුක්ත කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරනු ලැබූ සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ අයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය /දේශීය) විදේශීය)	නිමැවුම ලබා ගත්/දැනුම
			දේශීය	විදේශීය		
නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්	30	දින 1	**165,300**		දේශීය	ධාරිතා සංවර්ධන වැඩසටහන
හිමිකම් විමර්ශන නිලධාරී	643	දින 3	**2,385,856**		දේශීය	1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත හා ඊට සමගාමීව යන සියලු ඉඩම් නීති පිළිබඳව දැනුවත් කිරීම හා පසෙක තැබූ ගොනු සඳහා තීරණ ලබා දීමට අදාළ දැනුවත් කිරීම
කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී	2	දින 1	**14,000**		දේශීය	ප්‍රවාහන කළමනාකරණය පිළිබඳව දැනුවත් කිරීම
කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී	5	දින 2	**65,000**		දේශීය	පුද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යන ආකාරය පිළිබඳ වැඩමුළුව
කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී	4	දින 1	**48,000**		දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ වැඩමුළුව
කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී	220	දින 1	**240,450**		දේශීය	කාර්යාල ක්‍රම සම්බන්ධ දැනුවත් කිරීම
නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්	1	දින 2	**30,000**		දේශීය	ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සමුළුව 2024 (NITC)
නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්	9	දීර්ඝ කාලීන	**1,311,800**		දේශීය	සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කළ යුතු පාඨමාලා වෙනුවෙන්
හිමිකම් විමර්ශන නිලධාරී	16	දින 2	**187,045**		දේශීය	බිම් සවිය වැඩසටහනට අදාළව සම්මත කාර්ය පටිපාටි සංග්‍රහය සකස් කිරීමේ පුහුණුව
කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී	3	දින 10	**67,000**		දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ වැඩමුළුව හා සරප් රාජකාරී සම්බන්ධ පුහුණුව
කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී/ කාර්යාල සේවක සේවය/ රියදුරු	50	දීර්ඝ කාලීන	**276,637**		දේශීය	සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කළ යුතු පාඨමාලා වෙනුවෙන් (භාෂා ප්‍රවීණතාව හා රියදුරු පුහුණුව)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර/නිලධාරී	1	දින 1	**15,000**		දේශීය	ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සමුළුව 2024 (NITC)
එකතුව	984	12	**4,806,088**			

ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි පුහුණු වැඩසටහන් වල දායකත්වය

මෙම දෙපාර්තමේන්තුවේ හිමිකම් විමර්ශන නිලධාරීන් සඳහා 2024 වර්ෂයේ ලබා දෙන ලද පුහුණු වැඩසටහන් මඟින් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත හා එහි සංශෝධන අනුව දෙපාර්තමේන්තු ක්‍රියාදාමය ක්‍රමවත්ව හා නිවැරදිව පවත්වා ගෙන යාම පිළිබඳව දැනුවත් කිරීමක්ද, පෞද්ගලික ඉඩම් අයිතිය පිළිබඳව අවසානාත්මක තීරණයක් ලබාදීම සඳහා වන නිවැරදි විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන දැනුම ලබාගැනීමද, හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රමවේද, නෛතික පසුබිම, 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත හා එහි සංශෝධන පිළිබඳ අවබෝධය ලබාගැනීම යන පුහුණු වැඩසටහන් පවත්වන ලදි. මෙමඟින් පනතේ විධි විධාන පිළිබඳ පුළුල් විෂය දැනුමක් එම නිලධාරීන් වෙත ලබා දීමෙන් හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය (බිම් සවිය වැඩසටහන) සාර්ථකව සිදු කිරීමට අපේක්ෂා කරනු ලබයි.

එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සේවා නිලධාරීන්/කාර්යාල සේවක සේවයේ නිලධාරීන් වෙත කාර්යාල ක්‍රම පුහුණුව සඳහා රාජ්‍ය සේවය තුළ තම රාජකාරී භූමිකාවේ ඇති වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන මඟින් නිලධාරීන්ගේ විෂය දැනුම හා ආකල්පමය වර්ධනයක් තුළින් ආයතනයේ කාර්ය සාධනය වර්ධනය කරගැනීමට බලාපොරොත්තු වේ.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	ව්‍යාපාර හා නිෂ්පාදන ගිණුමක් නොපවතී	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	ගබඩා අත්තිකාරම් ගිණුම් සකස් නොකරයි	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	විශේෂ අත්තිකාරම් ගිණුමක් නොපවතී	
1.6	වෙනත්	-		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ප්‍රායෝගික ගැටළු නිසා විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමට මාසයකට වැඩි කාලයක් ගත වේ. (ප්‍රාදේශීය කාර්යාල වෙතින් වාර්තා කැඳවා පිළිතුරු ලබා දීමට සිදුවන අවස්ථා	විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී නිළධාරීන් දැනුවත් කිරීමට කටයුතු කිරීම

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
			වලදී)	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අක්‍රිය බැංකු ගිණුම් නොපවතී	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	P.G.D.I.N. රණසිංහ මයා 2024.03.05 දින රු.175723/= ක මුදලක් පියවා ඇත. (A/25 0961832) නැවත සේවයේ පිහිටුවීමට අභියාචනා ඉදිරිපත් කර නැත. (රු.26,951.54 ක මුදලක් අයවිය යුතු බව LSD/ACC/08/SALARY/2024/0 හා 2024.07.02 දිනැති ලිපියෙන් දුන් දැනුම් දීම අනුව 01/04/01/01/341 සහ 2024.07.26 දිනැති ලිපියෙන් එම මුදල ගෙවීමට කටයුතු කරන ලෙස නිලධාරියාට දැනුම් දී ඇත. U.G.ජයවර්ධන මයාට විරුද්ධව පැවති අධිකරණ කටයුතු නිම වී ඇති අතර ඒ බව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇත. නැවත සේවයේ පිහිටුවීම පිළිබඳව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ප්‍රාදේශීය කාර්යාල සඳහා නිකුත් කරනු ලබන අතුරු අග්‍රිම තැපැල් මඟින් චෙක්පත් යොමු කිරීම හා පියවීම් වවුචර්පත් ගෙන්වා ගැනීම නිසා යම් කිසි කාලයක් ගත වීම	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	ආදායම් ගිණුම් නොපවතී	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල නොවේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09. 20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

නිරවුල් කිරීමේ නිලධාරීන් / කොමසාරිස්වරුන්ගේ/ කොමසාරිස් ජනරාල්වරුන්ගේ නාම ලේඛනය

1903 – 1905	ජේ.ජී. ෆ්‍රේසර් මහතා
1906	එච්.ඕ. ෆොක්ස් මහතා (වැ.බ.)
1907 – 1912	ජේ.ජී. ෆ්‍රේසර් මහතා
1913	එච්.ඕ. ෆොක්ස් මහතා
1914	ජේ.එම්. ඩේවිස් මහතා (වැ.බ.)
1915 -1917	එච්.ඕ. ෆොක්ස් මහතා
1918	ජේ.එම්. ඩේවිස් මහතා (වැ.බ.)
1919 – 1920	එච්.ඕ. ෆොක්ස් මහතා
1921	ඩබ්ලිව්.ඊ. වේට් මහතා
1922 – 1923	එම්.එම්. වෙදර්බර්න් මහතා (වැ.බ.)
1924	එම්.ටී. ආච්බල්ඩ් මහතා (වැ.බ.)
1925	එෆ්. බාට්ලට් මහතා
1926 – 1927	එම්.ටී. ආච්බල්ඩ් මහතා (වැ.බ.)
1928	එම්.ටී. ආච්බල්ඩ් මහතා
1929 – 1930	ඩබ්ලිව්.ටී. ස්ටෙස් මහතා
1931 – 1936	එච්.ඊ. ජෑන්ස් මහතා (වැ.බ.)
1937 – 1939	එච්.ඊ. ජෑන්ස් මහතා
1940	සී.එල්. වික්‍රමසිංහ මහතා
1941 – 1944	එච්.ඊ. ජෑන්ස් මහතා
1945 – 1947	සී.බී.පී. පෙරේරා මහතා (වැ.බ.)
1948 – 1950	සී.බී.පී. පෙරේරා මහතා
1951 – 1954	එම්.ඩබ්ලිව්.එෆ්. අබේකෝන් මහතා (වැ.බ.)
1955 – 1958	එම්.ඩබ්ලිව්.එෆ්. අබේකෝන් මහතා
1959	එස්.එල්. ද සිල්වා මහතා (වැ.බ.)
1960	ආර්.ටී. රත්නතුංග මහතා (වැ.බ.)
1961 – 1963	ආර්.ටී. රත්නතුංග මහතා
1964 – 1974	එස්.එල්. ද සිල්වා මහතා
1975 – 1978	සී.එස්. රණසූරිය මහතා
1979 – 1980	අයි.ඒ. එදිරිවීර මහතා
1981 – 1983	කේ.පී. විමලධර්ම මහතා
1984 – 1987	ආර්.ඩබ්ලිව්. පියසේන මහතා
1988	ඒ. බොරළුගොඩ මහතා (වැ.බ.)
1989	ඩී.ජී.පී. සෙනෙවිරත්න මහතා
1990 – 1993	ආර්.එම්.සී.පී. උඩුගම්පල මහත්මිය
1994	එච්. උඩකන්දගේ මහතා (වැ.බ.)
1995 - 1997	ආර්.එම්.සී.පී. උඩුගම්පල මහත්මිය
1997 – 2001	එච්. උඩකන්දගේ මහතා
2002 – 2003	එස්. එච්. විතානගේ මහතා
2004 – 2005	කේ.ඒ.ඩී.පී. පෝල් මහතා
2006 – 2008	පී.ඒ. මුතුකුමාරණ මහතා
2009 – 2010	ජී. විජිත නන්ද කුමාර් මහතා
2011	එල්.කේ. පේමරත්න මහතා
2012 - 2013	ඒ.එච්.එස්. විජේසිංහ මහතා
2013 - 2015	ගාමිණී ඉලංගරත්න මහතා
2015	ජී. විජිත නන්ද කුමාර් මහතා
2015 - 2018	කේ. ඒ. කේ. රංජිත් ධර්මපාල මහතා
2019 - 2022.09.28	පී.එම්.එච්. ප්‍රියදර්ශනී මහත්මිය
2022.09.29 සිට මේ දක්වා	පී.සී.ඩී.සිගේරා මහත්මිය

ක.සේ.නි. - කළමනාකරණ සේවා නිලධාරී
හි.වි.නි. - සහකාර හිමිකම් විමර්ශන නිලධාරී
ලේ.වි.නි. - ලේඛන විමර්ශන නිලධාරී
ලේ.ස. - ලේඛන සංරක්ෂක
සං.නි. - සංවර්ධන නිලධාරී
තො.ස.තා.නි. - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
කා.කා.ස. - කාර්යාල කාර්ය සහායක

ඇමුණුම අංක **02**

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්
ශ්‍රී.ලං.ප.සේ.විශේෂ ශ්‍රේණිය
(ගණන් දීමේ නිලධාරී හා ප්‍රධාන පරිපාලන නිලධාරී)

- කොමසාරිස් (දිස්ත්‍රික්) ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය
- කොමසාරිස් (ඉඩම්) ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය (ඉඩම් නිරවුල් කිරීම හා සම්බන්ධ සියලු කටයුතු)
- කොමසාරිස් (පාලන) ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය (සාමාන්‍ය පරිපාලන කටයුතු)
- කොමසාරිස් (බිම් සවිය/විමර්ශන) ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය (හිමිකම් ලියාපදිංචි කිරීම හා සම්බන්ධ සියලු කටයුතු)
- ප්‍රධාන ගණකාධිකාරි ශ්‍රී.ලං.ග.සේ. I පන්තිය
- ප්‍රධාන අභ්‍යන්තර විගණක ශ්‍රී.ලං.ග.සේ. I පන්තිය

කොමසාරිස් (ඉඩම්) යටතේ

- නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් (ඉඩම්) ශ්‍රී.ලං.ප.සේ. II/III පන්තිය
  - ඉඩම් අංශය
    - ප්‍රධාන ක.සේ.නි
      - ක.සේ.නි./සං.නි.
        - කා.කා.ස
    - ලේඛනාගාරය
      - ලේ.වි.නි.
        - ලේ.ස.
          - කා.කා.ස.
- නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් (පාලන) ශ්‍රී.ලං.ප.සේ. II/III පන්තිය
  - පරිපාලන නිලධාරී
    - ප්‍රධාන ක.සේ.නි
      - ක.සේ.නි./සං.නි.
        - කා.කා.ස
        - රියදුරු
  - භාෂා පරිවර්තක
- නීති නිලධාරී
  - ක.සේ.නි./ සං.නි.
    - කා.කා.ස

කොමසාරිස් (පාලන) යටතේ

- නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් (විමර්ශන) ශ්‍රී.ලං.ප.සේ. II/III පන්තිය
  - විමර්ශන අංශය
    - හි.වි.නි/ සං.නි.
      - ක.සේ.නි
        - කා.කා.ස
- නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (පරිගණක/සැලසුම්/ ප්‍රකාශන) ශ්‍රී.ලං.ප.සේ. II/III පන්තිය
  - පරිගණක අංශය
    - තො.සං.තා.නි.
      - ක.සේ.නි./ සං.නි./ තො.සං.තා.ස.
        - කා.කා.ස
  - ප්‍රකාශන අංශය
    - ප්‍රධාන ක.සේ.නි
      - ක.සේ.නි./ සං.නි./ තො.සං.තා.ස.
        - කා.කා.ස
  - සැලසුම් අංශය
    - ප්‍රධාන ක.සේ.නි
      - ක.සේ.නි./ සං.නි./ තො.සං.තා.ස.
        - කා.කා.ස

කොමසාරිස් (බිම් සවිය/විමර්ශන) යටතේ

- නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් (ප්‍රා.කාර්යාල) ශ්‍රී.ලං.ප.සේ. II/III පන්තිය
  - හි.වි.නි /සං.නි
    - ක.සේ.නි./ තො.සං.තා.ස.
      - කා.කා.ස
      - රියදුරු

ප්‍රධාන ගණකාධිකාරි යටතේ

- ගණකාධිකාරි (ප්‍රසම්පාදන) ශ්‍රී.ලං.ග.සේ. II/III පන්තිය
  - ප්‍රසම්පාදන අංශය
    - ප්‍රධාන ක.සේ.නි
      - ක.සේ.නි./ සං.නි./
        - කා.කා.ස
- ගණකාධිකාරි (ගිණුම්) ශ්‍රී.ලං.ග.සේ. II/III පන්තිය
  - ගිණුම් අංශය
    - ප්‍රධාන ක.සේ.නි
      - ක.සේ.නි./ සං.නි./
        - කා.කා.ස
  - සරප්

ප්‍රධාන අභ්‍යන්තර විගණක යටතේ

- ක.සේ.නි
  - කා.කා.ස

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ARI/E/LSD/FA/2/24/10 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2025 මැයි 26 දින

ගණන්දීමේ නිලධාරී

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **මතය**

ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය

මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

2024 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙත වැය විෂයයන් 04 කට අදාළව වෙන් කරන ලද රු.51,250,000 ක ප්‍රතිපාදන වලින් රු.31,200,063 ක් එනම් සියයට 23 ත් 96 ත් අතර ප්‍රතිශතයකින් ඉතිරි වී තිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

නීති රීති හා රෙගුලාසිය	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති	සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් වර්ෂ 01 ත් 03 ත් අතර පවතින හිඟ ණය ශේෂය රු.184,200 ක් වූ අතර වැඩ තහනම් කළ නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු එකතු ණය ශේෂය රු. 124,001 ක් විය.එම ණය ශේෂය තුළ වර්ෂ 05 ට වැඩි ණය ශේෂ රු.93,730 ක් සහ වර්ෂ 01 ත් 03 ත් අතර ණය ශේෂය රු. 30,271 ක් විය.
(ආ) 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය	දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර එය මහජනයාට විවෘත වන පරිදි ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි මුදල් රෙගුලාසි අංක 371(5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් ගෙවන නිලධාරියා විසින් ස්වකීය අතුරු අග්‍රිමය පිළිබඳ ගණුන් හිලව් ඉදිරිපත් කළ යුතු අතර අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත් නියදි විගණනය අනුව 2024 වර්ෂයේ අවස්ථා 16 කදී නිකුත් කරන ලද එකතු වටිනාකම රු.1,163,652 ක් වූ අග්‍රිම නියමිත දිනට පියවා නොතිබුණි.

3.4 අවධිමත් ගණුදෙනු

(අ) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6 වන ඡේදයේ සඳහන් පරිදි විදේශීය අනුග්‍රහක ආයතනය විසින් පූර්ණ පිරිවැය දරන්නේනම් මිස විදේශීය අධ්‍යයන/පුහුණු/සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් සහභාගී නොකළ යුතු මෙන්ම,මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 01/2015/01 හා 2015 මැයි 15 දිනැති චක්‍රලේඛයේ 04 (අ) වගන්තිය ප්‍රකාරව නවාතැන් හා ආහාර පාන සඳහා වූ වියදම් විදේශ රජය හෝ ප්‍රදාන ආයතනය විසින් නොදරනු ලබන විටදී පමණක් සංයුක්ත දීමනා ලබාගත හැකි වුවත්, 2024 වර්ෂයේ පැවැත් වූ ලෝක ඉඩම් සමුළුවට සහභාගිවන නිලධාරීන් සඳහා ගමන් වියදම්, ලියාපදිංචි ගාස්තු, ගුවන් ටිකට්පත් ගාස්තු, ගමනා ගමන පහසුකම්, නවාතැන් පහසුකම් හා ආහාර පාන ලබාදෙන බවට ලෝක බැංකුවේ ශ්‍රී ලංකා හා මාලදිවයින් කළමනාකරුගේ 2024 මාර්තු 13 දිනැති ලිපියෙහි සඳහන් වී තිබුණි. එයට පටහැනි ලෙස එක් නිලධාරියකුට සංයුක්ත දීමනාව එක් දිනකට ඇ.ඩො. 129.85 බැගින් දින 09 ක් සඳහා ගෙවා ඇති සම්පූර්ණ මුදල රු. 354,264 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1. සැලැසුම් කිරීම

බිම්සවිය වැඩසටහනට සෘජුවම සම්බන්ධ ආයතනයන්හි ඇති හැකියාව,මානව සහ භෞතික සම්පත් ප්‍රමාණය මගින් ඉටුකිරීමට ඇති රාජකාරී සම්බන්ධයෙන් අධ්‍යනය නොකර, පවත්නා රාජ්‍ය අවශ්‍යතා අනුව වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. මෙම වැඩසටහන ප්‍රමුඛතාවයක් දිය යුතු කුමන දිස්ත්‍රික්ක පිළිබඳව කිසිදු සැලැස්මක් සකස් කර නොතිබුණි.1998 සිට ආරම්භ කර ඇති මෙම වැඩසටහනට අදාළව වැඩ අවසන් වූ හා මහජනතාවට හිමිකම් සහතික ලබාදී අවසන් කර ඇති කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් නොවූ අතර එම සහතිකපත් ලබාදී එම කාර්යයන් අවසන් වන දිනයක් හෝ ලබාදීමට නොහැකි තත්ත්වයක පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) බිම් සවිය වැඩසටහන 1998 වර්ෂයේ සිට නියාමන පදනමින් ක්‍රියාත්මක වී 2002 වර්ෂයේ සිට 2006 සැප්තැම්බර් මාසය දක්වා ලෝක බැංකු ආධාර යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස බලන්ගොඩ, දිවුලපිටිය, උඟව පළාත, තඹුත්තේගම සහ හෝමාගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක කර 2024 වර්ෂය වන විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 112 ක් ආවරණය වන පරිදි දිවයින තුළ ප්‍රාදේශීය කාර්යාල 57 ක් පිහිටුවා තිබුණි. 2024 වර්ෂයේදී ඉඩම් අමාත්‍යාංශයේ මගින් රු.මි.1000 ක ප්‍රතිපාදන බිම්සවිය වැඩසටහන හා සම්බන්ධිත ආයතන වෙත වෙන්කර ඇතත් ඒ සඳහා දරන ලද වියදම රු.මිලියන 619.5 ක් වුවත් එම වැය කිරීම් පිළිබඳව කිසිදු තොරතුරක් හෝ අධීක්ෂණයක් හෝ සිදුකල බවට සාක්ෂි ඉදිරිපත්

නොවීය. මෙම වැඩසටහනෙහි භෞතික කාර්ය සාධනය පරීක්ෂා කිරීමේදී 1998 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 12 වගන්තිය යටතේ ගැසට් කළ කඩඉම් සීතියම් සංඛ්‍යාව 10,936 ක් ද එහි කැබලි සංඛ්‍යාව1,781,502 ද වූ අතර එයින් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් විසින් අනුමත කළ කැබලි සංඛ්‍යාව 1,034,695 ක් ද එම අනුමත කළ සංඛ්‍යාවෙන් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ ගැසට් කළ කැබලි සංඛ්‍යාව 947,414 ක් විය.රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද ඉඩම් කැබලි 822,668 ක සංඛ්‍යාවෙන් මහජනයා වෙත නිකුත් කරන ලද හිමිකම් සහතික සංඛ්‍යාව 462,922 ක් විය. සර්වෙයර් ජනරාල් වරයාගේ වාර්තාවට අනුව දිවයින පුරා ඉඩම් කැබලි මිලියන 16 ක් පමණ ඇති අතර එයින් කැබලි 1,781,502 ක කටයුතු ක්‍රියාත්මක කර ඇතත් එය ප්‍රතිශතයක් ලෙස සියයට 11 ක් විය.එසේම විවිධ ගැටලු සහිත ඉඩම් කැබලි සම්බන්ධයෙන් ඉදිරියේදී තීරණ ගැනීම සඳහා පසෙක තබා තිබුණු සංඛ්‍යාව 500,739 ක් වී තිබුණි.

(ආ) බිම්සවිය වැඩසටහන සඳහා ඉඩම් අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන ලබාදෙන අතර ඒ අනුව අමාත්‍යාංශය, ,ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත 2007 වර්ෂයේ සිට 2024 දක්වා ලබා දුන් ප්‍රතිපාදනයෙන් දරන ලද වියදම දළ වශයෙන් රු.මිලියන 6,686.74 ක් වී තිබුණි. එසේම 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව දරන ලද වියදම රු.මිලියන 3,467.34 ක් වන අතර සමස්ත වශයෙන් දැරූ වියදම දළ වශයෙන් රු.මිලියන 10,154.08 ක් විය.ඒ අනුව එක් බිම් කැබැල්ලක් සඳහා හිමිකම් සහතිකයක් ලබාදීමට දැරීමට සිදුවූ වියදම දළ වශයෙන් රු.21,978 ක් වී තිබුණි. මෙම වැඩසටහන ආරම්භයේ සිට දැරූ වියදම සැලකිමේදි හිමිකම් සහතික ලබා දීමට දරන ලද වියදම මෙම වටිනාකම ඉක්මවන බව නිරීක්ෂණය විය. බිම්සවිය වැඩසටහන ඉදිරි වසර දහයක් එනම් 2033 වර්ෂය දක්වා සැලසුම් කර ඇති ආකාරයට ක්‍රියාත්මක කළහොත් දැරීමට අපේක්ෂිත වියදම රු.මිලියන 9,672.2 ක් වන අතර ඇස්තමේන්තු කරන ලද හිමිකම් සහතික සංඛ්‍යාව 1,777,036 ක් වේ. කෙසේ නමුත් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව දිවයින පුරා ඉඩම් කැබලි මිලියන 16 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එයින් මිලියන 2.1 ක් පමණ මැන ඇතත් තවදුරටත් මැනීමට ඉතිරි ඉඩම් කැබලි ප්‍රමාණය මිලියන 13.9 ක් බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රාදේශීය කාර්යාල ඉඩපහසුකම් සඳහා පෞද්ගලික ගොඩනැගිලි කුලී පදනම මත ගැනීම හේතුවෙන් විගණනයට ලබා ගත හැකිවූ තොරතුරු අනුව පසුගිය වර්ෂ 06 කට අදාළව (2019-2024) ගොඩනැගිලි කුලි හා ආරක්ෂක සේවා වියදම රු.මිලියන 288.89 ක් වී තිබුණි. 2024 වර්ෂයේදී ප්‍රාදේශීය කාර්යාල 34 ක් කුලීයට ගැනීම වෙනුවෙන් කුලිය ලෙස රු.21,351,447 ක්ද

ආරක්ෂක සේවාවන් වෙතුවෙන් රු.28,426,362 ක්ද බාහිර පාර්ශවයන් වෙත ගෙවීම් කර තිබුණි.

(ඇ) මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මෙම වැඩසටහන යටතේ ඉඩම් මැනීම සඳහා දිරි දීමනා ක්‍රමයක් යොජනා කර සර්වේයර් ජනරාල් වරයා විසින් ලිපියක් යොමු කර එමගින් බිම් සවිය ක්‍රියාවලිය 2022 වර්ෂය වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද ඒ සඳහා නියමිත යටිතල පහසුකම් ප්‍රමාණවත්ව නොලැබීම සහ ජාතිකමය ප්‍රතිපත්ති රාමුවක් මත සැලසුම් ක්‍රියාත්මක නොකිරීම නිසා 2024 වර්ෂය අවසන් වන විට තවදුරටත් ඉඩම් කැබලි මිලියන 10 ක් පමණ මැනීමට ඉතිරිව තිබෙන එම ඉඩම් කැබලි සාමාන්‍ය රාජකාරී වෙලාවන් තුළ සමස්ත මානව සහ භෞතික සම්පත් උපයෝගී කරගෙන සිදු කිරීමට තවත් වසර 69 ක් පමණ ගත වන අතර දිරිදීමනා ක්‍රමය ක්‍රියාත්මක කළහොත් 2025 වර්ෂයේ සිට ඉදිරියට වාර්ෂිකව බිම් කැබලි 504,000 ක් රු. මිලියන 2,250 ක වාර්ෂික වියදමකින්, වැටුප් ද ඇතුළත්ව නිම කළ හැකි බව සඳහන් කර තිබුණි. එම ගණනය කිරීම අනුව ඉඩම් කැබලි මිලියන 10 ක ප්‍රමාණය මැනුම් කටයුතු සිදු කිරීමට පමණක් වසර 20 ක කාලයක් සඳහා රු.මිලියන 45,000 ක් පමණ වැය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. මෙම දෙපාර්තමේන්තුවට ලබාදෙන දිරිදීමනා ක්‍රමයට මෙම කාර්ය සඳහා සම්බන්ධ වන හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවට හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට ද ලබාදීමට යෝජනා වී තිබුණි. ඒ අනුව එම ආයතන වෙතද දිරිදීමනා ලබා දුන්නහොත් වැයවන වියදම ගණනය කිරීමට නොහැකි තරම් වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඉ) දෙපාර්තුමේන්තුවෙහි පැරණි ලේඛණ පරිලෝකනය කර සංරක්ෂණය කිරීමේ කටයුත්ත අදියර 03ක් යටතේ සිදු කිරීම සඳහා 2021 වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර එමගින් මෙම ක්‍රියාවලියට ලක් කරනු ලබන ලිපිගොනු භෞතිකව පරීක්ෂා කළ අතර ඒවා වසර සියයකට වඩා පැරණි ලේඛණ විනාශ වෙමින් පවතින නිසා මෙම ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. තව ද දෙපාර්තුමේන්තුවට අයත් ලේඛණ ප්‍රමාණයක් ලේඛණාරක්ෂක දෙපාර්තුමේන්තුව වෙත භාර දී තිබුණි. මෙම කාර්යය ඉටු කිරීම සඳහා 2023 වර්ෂයේ සිට ටෙක් වන් ගෝබල් ලංකා පුද්ගලික සමාගම වෙත රු.11,036,136 ක මුදලක් ගෙවීම් කර තිබුණි. 2022 වර්ෂයේ සිට ඡායාරූපගත කරමින් මෙම තොරතුරු පරිගණක මාර්ගයෙන් ගබඩාකර ඇතත් එම තොරතුරුවලින් අවශ්‍ය තොරතුරු මෘදු පිටපත් ආකාරයෙන් හෝ දෘඩපිටපත් ආකාරයෙන් පරිශීලනය කිරීමට 2025 අප්‍රේල් 10 දින වන විටත් පහසුකම් සපයා දී නොතිබුණි. ලේඛන සංරක්ෂණය කිරීමේදී පැරණි ලේඛන ලිපි ගොනුවම සංරක්ෂණය කටයුතු සඳහා භාරදී ඇති අතර එම ලිපිගොනු වලින් සංරක්ෂණය කළ යුතුම ලේඛණ මොනවාද යන්න සහ ඉවත්කළ යුතු ලේඛණ ඇත්නම් ඒවා ඉවත් කිරීමට නිසි උපදෙස් ලබා දීමක් කර නොතිබුණි. එසේම සංරක්ෂණය කරන ලද ලේඛණ පරිශීලනය කිරීමේ පහසුව සඳහා නවීන තාක්ෂණයෙන් යුත් පරිසරක පද්ධතියක් ස්ථාපිත

කිරීමට අවශ්‍ය සර්වර් (Server) පද්ධතියක් මිලදී ගැනීම සඳහා 2024 වර්ෂයේදී වෙන්කළ ප්‍රතිපාදනය වූ රු.14,000,000 ක මුදල වියදම් නොවී ඉතිරිව පැවතුණි.

4.2 වත්කම් කළමනාකරණය

4.2.1 කොමසාරිස් ජනරාල්වරයා වෙනුවෙන් රු.25,077,183 ක වියදමින් ඉදිකල නිල නිවස 2020 සැප්තැම්බර් 01 දින සිට 2025 පෙබරවාරි 28 දින දක්වා කාලය නිලධාරීන් දෙදෙනෙකුට වැඩි සංඛ්‍යාවකට පදිංචියට ලබාදී තිබුණි.ඒ සඳහා ආයතන සංග්‍රහයේ 5.5.1 වගන්තිය අනුව නිල නිවාසයක හවුලේ පදිංචි වන සෑම හවුල් පදිංචිකරුවෙකුගෙන්ම වැටුපෙන් සියයට 10 බැගින් අය කළ යුතු බව හා ප්‍රධාන බදුකරුගෙන් 5.2.1 හෝ 5.3.1 හෝ උප වගන්තිවල සඳහන් පරිදි නිවාස කුලී අවස්ථාවෝචිත පරිදි අය කළ යුතු වේ.එසේම ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූ.රෙ.142(1) අනුව රජයට ලැබිය යුතු මුදල් හා එම මුදල් අයකර ගත යුතු පුද්ගලයින් කවුරුන්ද යන්න සොයා බලා රජයට අගතියක් හෝ රජයට අයුතු පාඩුවක් සිදු නොවන පරිදි නිල නිවාස පාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් කඩිනමින් සකස් කර නොතිබුණි. නිල නිවාසයේ ඇතුළත කාමරවල ලිපි ද්‍රව්‍ය සහ පැරණි උපකරණ ගබඩා කිරීම හේතුවෙන් එය ගබඩාවක් ලෙස සහ තාවකාලික නවාතැන් ලබා දීමක් සිදුකර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම තත්වය රජයේ මුදල් නිසි සැලසුමකින් තොරව භාවිතා කිරීමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.

4.2.2 වාහන පාලනය

(අ) දෙපාර්තමේන්තුව සතු වාහන 41 ක් සඳහා 2024 නඩත්තු වියදම රු.26,784,278 ක් වූ අතර ඒවා ප්‍රාදේශීය කාර්යාලය 57 ක් දිස්ත්‍රික්ක 19 ක් සඳහා අනියුක්ත කර තිබුණි. වාහන අලුත්වැඩියා කටයුතු සඳහා වූ වියදම් බිම්සවිය වැඩසටහන සඳහා දරන ලද වියදමෙන්ද වැඩි ප්‍රමාණයක් දරා ඇතත් මෙම වැඩසටහන සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති නිසා භෞතික කාර්යසාධනය අඩු මට්ටමක පැවතීම හේතුවෙන් දරන ලද වාහන නඩත්තු වියදම් ඵලදායී වියදම් බවට පත්කිරීම සඳහා කඩිනම් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) වාහන 04 ක් අලුත්වැඩියා කළ යුතු මට්ටමක පවතියද ඒවා කඩිනමින් අලුත්වැඩියා සිදු නොකලහොත් තවදුරටත් මෙම වාහන අබලන් තත්ත්වයට පත්වීම කඩිනම් වන බැවින් අලුත්වැඩියා කිරීම හෝ එසේ කිරීම ඵලදායී නොවේ නම් අපහරණ ක්‍රියාවන් සඳහා යොමුවීම කඩිනමින් සිදු කළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.3 අනාර්ථික ගණුදෙනු

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව පරිහරනය කරනු ලබන රත්මලාන ලෝක ආහාර ගබඩා සංකීර්ණයේ ගොඩනැගිල්ලක් මොරටුව,රත්මලාන හා දෙහිවල බිම්සවිය ප්‍රාදේශීය කාර්යාල 03 ස්ථාපිත කිරීමට පළමු අදියර යටතේ ගෙබිම අලුත්වැඩියාව,විදුලි පද්ධතිය

අලුත්වැඩියාව,කපරාදුව,සනීපාරක්ෂක ඉදිකිරීම් හා තීන්ත ආලේප කිරීම වෙනුවෙන් රු.4,999,810 ක මුදලක්ද දෙවැනි අදියර යටතේ ඇලුමිනියම් පාටිෂන් කිරීම සහ ඇලුමිනියම් දොර ජනෙල් සවිකිරීම සඳහා රු.4,963,560 ක මුදලක් කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවීම් කර 2023.12.22 දින වන විට අවසන් කර එහි 2024 අගෝස්තු 16 දින සිට එනම් මාස 08 කට පසු මොරටුව ප්‍රාදේශිය කාර්යාලය පමණක් එහි කාර්යාල කටයුතු ආරම්භකර තිබුණි.එම ගොඩනැගිල්ලට ඒම සඳහා ලබාගත් අත්තිකාරම් මුදලින් කාර්යාලයට භාණ්ඩ ප්‍රවාහන හා අනෙකුත් කටයුතු වෙනුවෙන් රු.141,585 ක් දරා තිබුණි. ගබඩාවෙහි වහලය සැකසීම සඳහා 2024 දෙසැම්බර් 24 දින එම්.එල්.එල්.මදුරංග යන අය වෙත රු.295,145 ක්ද ලබාදී තිබූ අතර 2024 නොවැම්බර් 06 දින මෙම පරිශ්‍රයේ ඇති ගස් කපා ඉවත් කිරීම සඳහා රු.18,000 ක්ද ගෙවීම්කර තිබුණි.එකතුව රු.10,418,100 ක් වැයකර අදාල අලුත්වැඩියා කටයුතු කරන ලද මෙම ගොඩනැගිල්ලෙහි මොරටුව කාර්යාලය පවත්වාගෙන යාමට නොහැකි බව තීරණයවී 2025 පෙබරවාරි 10 දින නුගේගොඩ දෙල්කද පිහිටි කාර්යාලය වෙත නැවත මාරු කිරීම හේතුවෙන් එම දරන ලද පිරිවැය අනාර්ථික වියදමක් බවට පත් කරමින් 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම කාර්යාලය 2025 අප්‍රේල් මාසය වන විට කාර්යාල 04 ක් වෙත මාරුකර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. එසේම ඉහත ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට යොජිතව තිබූ අනෙකුත් කාර්යාල 02 ක 2025 අප්‍රේල් මාසය දක්වා මෙම ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කර නොමැති අතර එම කාර්යාල භෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යාම නිසා අදාළ කාලය සඳහා රු.1,485,000 ක කුලී ගාස්තු ගෙවා තිබූ අතර වර්ෂයක් තුල ප්‍රාදේශීය කාර්යාල කිහිප අවස්ථාවකදීම වෙනත් ස්ථාන වෙත මාරු කර තිබුණි.එම කාර්යාල වරින් වර විවිධ ස්ථානයන් වෙත රැගෙන යාම සහ ස්ථාපනය කිරීම සඳහා විධිමත් අනුමැතියක් ලබාගත් බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවීය.

4.4 **කළමනාකරණ දුර්වලතා**

(අ) 2024 වර්ෂය ආරම්භයේදී සමස්ත දිවයින තුළ බිම් සවිය වැඩසටහනේ හිමිකම් සහතික ප්‍රාදේශීය කාර්යාල 57 ක් මඟින් ඉඩම් කැබලි 110,000 කට හිමිකම් සහතික ලබාදීමට ඇස්තමේන්තු කර පසුව එම සැලසුම 70,000 ක් දක්වා එනම් සියයට 60 කින් ඉලක්කය අඩුකර තිබුණි. සත්‍ය ලෙස සහතික නිකුත් කල ප්‍රමාණය ඉඩම් කැබලි 40,389 ක් වූ අතර බිම් කැබලි වල පවත්නා ගැටලු නිසා පසෙක තැබූ ඉඩම් ගොනු කැබලි ප්‍රමාණය 58,320 ක් වී තිබුණි. ඒ අනුව එක් බිම් කැබැල්ලක් සඳහා සහතිකයක් ලබා දීමට දැරීමට සිදුවන වියදම දල වශයෙන් රු.35,073 ක් වන බැවින් තවදුරටත් සහතික නිකුත් කිරීමට ඇති බිම් කැබලි මිලියන 16 කට සහතික නිකුත් කිරීම සඳහා දල වශයෙන් ඉදිරියේදී දැරීමට සිදුවන වියදම රු.මිලියන 561,160ක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) බිම්සවිය වැඩසටහනේ භෞතික ප්‍රගතිය හා කාර්යසාධනය පිළිබඳ මොරටුව, රත්මලාන, දෙහිවල, කෝට්ටේ සහ හෝමාගම පිහිටි ප්‍රදේශීය කාර්යාල වෙතද, මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙතද ගොස් සිදුකල විගණන පරීක්ෂාවේදී එයට බලපෑ හේතු අතර මානව හා භෞතික සම්පත් වල පවතින හිඟතාවය, එක් අධීක්ෂණ නිලධාරියෙකු කාර්යාල 02 ක හෝ

03 ක රාජකාරී කටයුතු ආවරණය මෙන්ම ඔවුන් එම කාර්යාල වල රැඳී නොසිටීම, ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකර නොතිබීම, නිලධාරීන් පැමිණීමේ ලේඛනය වෙනස් කිරීම, මහජන දිනය වූ 2025 ජනවාරි 06 වන දින පෙරවරු 9.30 වනවිට මොරටුව ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරීන් 05 කින් එක් කළමනාකරණ සහකාරවරියක් සේවයට වාර්තාකර 04 දෙනෙකු නිවාඩු ගැනීම,දින ගණනක් ක්ෂේත්‍රයේ සහ ඉඩම් රෙජිස්ට්ර් කාර්යාලයේ රාජකාරී කටයුතු කළ බව සඳහන් කරමින් සංයුක්ත දීමනා සහ වැටුප් ලබාගෙන තිබීම, නිලධාරීන් පුරුද්දක් ලෙස බැහැර යාමේ ලේඛනයේ සටහන් කරමින් දින තුන හතරක් අතර මොරටුව, හෝමාගම කලාපයන්හි මැනීම් කටයුතු සිදුකල බවට ලේඛන පැවැත්වීම ,2007 වර්ෂයේ පමණ ආරම්භ කර ඇති අතර 2024 වර්ෂයේදී ද මෙම ප්‍රාදේශීය කාර්යාල දෙකෙහි පමණක් නිලධාරීන් 20 දෙනෙකු මාසයකට දින 10-15 අතර කාලයක් එනම් මිනිස් දින 2,400 ක් පමණ ප්‍රමාණයක් ක්ෂේත්‍රයේ රාජකාරී කටයුතු ඉටුකිරීම විගණනයේදී ගැටලු සහගත තත්ත්වයක් බව නිරීක්ෂණය කරමි.

(ඇ) ඉඩම් නිමිකම් සහතික ලබාදීමට අදාළ පනත් වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය නොවීම.ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් ඉඩම් ලියාපදිංචි පත්තිරු විස්තර ලබා ගැනීම, ලේඛන පරීක්ෂා කිරීම දීර්ඝ කාලයක් ගතවීම සහ ඇතැම් දිනයන්හි එම ලේඛන ලබා ගැනීමට නොහැකිව නිලධාරීන් ආපසු පැමිණෙන අවස්ථාවන් සඳහා නිවැරදි විසඳුම් ලබා නොදීම.

(ඈ) දෙපාර්තමේන්තුවේ ගෙවීම් වවුචර් පත්‍ර නිසිපරිදි ගොනු නොකිරීම හා වැය ලෙජරයන් පවත්වාගෙන යාමේ දුර්වලතා.

(ඉ) රාජ්‍ය පරිපාලන කළමනාකරන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2017 පරිදි හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 හා 2009 ජුනි 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009(I) අනුව සෑම රාජ්‍ය ආයතනයකට ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් නිලධාරීන්ගේ රාජකාරිය සඳහා පැමිණීම සහ පිටවීම අත්සන් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීම සිදු කළ යුතු වූවත් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 57 ක් පිහිටුවා ඇතත්, ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කර නොමැති වීමත්, එම කාර්යාල වල ස්ථිර පදනමින් බඳවාගත් අධීක්ෂණ නිලධාරීන් නොමැතිකම නිසා රාජකාරී ඉටු කිරීම මත හා වැඩ බැලීමේ පත්වීම් සිදුකර ඇති තත්වයක් පැවතීමත්, අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වූ අතර දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ වැටුප් හා වේතන, වෙනත් දීමනා, අතිකාල හා නිවාඩු දින වැටුප් හා ගමන් වියදම් ලෙස රු.මිලියන 724.95 ක් දරා ඇතත් එම වියදම් ගෙවීම සම්බන්ධව විගණනයට සෑහීමකට පත්විය නොහැකි තත්ත්වයක් නිරීක්ෂණය විය.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	105	36	69
තෘතීයික	07	05	02
ද්විතියික	1746	844	902
ප්‍රාථමික	254	164	90
එකතුව	**2112**	**1049**	**1063**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රාදේශීය කාර්යාල 57 ක අධීක්ෂණ නිලධාරීන්ගේ හිඟය නිසා වැඩබැලීමේ තනතුරු ලෙස සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් 13 දෙනෙකු හා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 16 දෙනෙකු වැඩබැලීමේ තනතුරු සඳහා පත්කර තිබුණි. මේ සඳහා 2024 වර්ෂය තුළදී ගෙවීම් කර ඇති මුදල රු 2,511,487 ක් බව නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුවට අනුමත සංඛ්‍යාව 2112 ක් වන අතර තත්‍ය සංඛ්‍යාව 1049 ක් විය. එම පුරප්පාඩු අනුමත කිරීමේ දී එම දිස්ත්‍රික්ක වල ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන සැලකිල්ලට ගෙන කාර්ය අවශ්‍යතාවය කෙරෙහි නිසි ඇගයීමක් හෝ පවත්නා පුරප්පාඩු නැවත සමාලෝචනය කිරීමක් කර නොතිබුණි.

පී.කේ.එම්.පී.නෝනිස්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට

පී.කේ.එම්.පී. නෝනිස
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය